# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2147/65 - 2019 ඔක්තෝබර් මස 31 වැනි බ්‍රහස්පතින්දා - 2019.10.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

### ජනාධිපති ලේකම් කාර්යාලය

ජනාධිපති නීතිඥවරයන් පත් කිරීම සඳහා අයදුම්පත් කැඳවීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33(2)(ඉ) ව්‍යවස්ථාව අනුව ජනාධිපති නීතිඥවරයන් පත් කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. එබැවින් නීතිඥ වෘත්තියේ විශිෂ්ටත්වයට පත්ව ඇති සහ පැවැත්මේ හා වෘත්තියේ අවංකභාවයේ උත්කෘෂ්ඨත්වය පවත්වාගෙන ඇත්තාවූ නීතිඥවරයන් හට මේ සඳහා අයදුම් කිරීමට හිමිකම් ඇත.

ඒ අනුව, අංක 2147/37 හා 2019.10.29 දිනැති ගැසට් පත්‍රයේ පල කර ඇති මාර්ගෝපදේශයන් හි සඳහන් සුදුසුකම් සපුරන නීතිඥවරුන් විසින් පහත ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපැලෙන් 2019.11.07 හෝ එදිනට පෙර ලැබෙන පරිදි කොළඹ 01, ජනාධිපති ලේකම් කාර්යාලය, ජනාධිපති ලේකම් වෙත එවිය යුතුය.

අයදුම්පත්‍රය බහා ඇති කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි "ජනාධිපති නීතිඥවරයන් පත් කිරීම" යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතුය. එදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාර නොගන්නා අතර අයදුම්පත අස්ථානගතවීම හෝ ප්‍රමාදවීම සම්බන්ධයෙන් වග කියනු නොලැබේ.

අයදුම්පත්‍රය www.presidentsoffice.gov.lk ඔස්සේ ද බාගත කළ හැකිය.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

උදය ආර්. සෙනවිරත්න,
ජනාධිපති ලේකම්.

## ජනාධිපති නීතීඥවරයන් පත් කිරීම සඳහා අයදුම්පත්‍රය

| | |
|---|---|
| 01 | සම්පූර්ණ නම :- |
| | i. සිංහල භාෂාවෙන්:- |
| | ii. ඉංග්‍රීසි භාෂාවෙන්:- |
| 02 | i. ලිපිනය :-<br>ii. විද්‍යුත් ලිපිනය:-<br>iii. සම්බන්ධ කර ගත හැකි අංක:- (i) ජංගම :<br>(ii) නිවස :<br>(iii) කාර්යාලය :<br>(iv) වෙනත් : |
| 03 | උපන් දිනය:- වයස: |
| 04 | ජාතික හැඳුනුම්පත් අංකය:-<br>i. වෙනත් රටක / රටවල්වල පුරවැසිභාවය ලබා ගෙන ඇද්ද? |
| 05 | නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දුන් දිනය:-<br>i. නීතිඥ සංගමයේ සාමාජික අංකය:-<br>ii. සංගම් ශාඛාව :- දිස්ත්‍රික්කය:- |
| 06 | i. නොතාරිස් වෘත්තියේ යෙදීම සඳහා බලපත්‍ර ලබා ඇත්ද?<br>එසේ නම් නොතාරිස් කටයුතු ආරම්භ කළ දිනය:-<br>ii. ලේඛනගත නීතිඥවරයකු ලෙස කටයුතු කරන්නේ ද? |

| | |
|---|---|
| 07 | අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම්:-<br>(උපාධි සහ පශ්චාත් උපාධි ආදිය) |
| 08 | නීති වෘත්තියේ විශිෂ්ටත්වයට පත්ව තිබීම<br>i. සක්‍රීය සේවා කාලය;-<br>ii. පසුගිය වසර 20 තුළ සක්‍රීය ලෙස කටයුතු කරන ලද අධිකරණය;-<br>iii. විශේෂඥතාවය දක්වන නීති ක්ෂේත්‍රය;-<br>iv. නීතියේ උන්නතිය උදෙසා නීති තර්ක තුළින් දක්වන ලද සක්‍රීය දායකත්වය;-<br>(අයදුම්කරු පසුගිය වසර 5 තුළ අධිකරණයේ පෙනී සිටින ලද සැලකිය යුතු නඩු සහ නඩු වාර්තා (වාර්තාගත / වාර්තා ගත නොකරන ලද) වලට අදාල පිටුවල සහතික පිටපත්)<br>v. අයදුම්කරු විසින් පුහුණු කරන ලද කනිෂ්ඨ නීතීඥවරුන්ගේ නම්;- |
| 09 | වෘත්තීය කටයුතු පිළිබඳ අවංකභාවය හා උත්කෘෂ්ඨභාවය :-<br>i. රථ වාහන වරදකට හැර ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටතදී කිසියම් හෝ වරදකට වරදකරු කර හෝ වරද පිළිගැනීමක් කර තිබේද?<br>ii. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පවත්වනු ලබන අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් වූ නඩු කටයුත්තකට අයදුම්කරු භාජනය වී තිබේද? තිබුණිද?<br>වරදකරු කර ඇත්නම් දඬුවමේ ස්වභාවය:-<br>iii. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් හෝ ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් අයදුම්කරු වෘත්තීමය පැහැර හැරීමකට හෝ යම් අකටයුත්තක් සඳහා වූ පරීක්ෂණයකට භාජනය කර තිබේද? තිබුණිද?<br>වරදකරු කර ඇත්නම් දඬුවමේ ස්වභාවය:-<br>iv. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් හෝ ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් අයදුම්කරු විනය ක්‍රියාපටිපාටියකට ලක් කර තිබේද? තිබුණිද?<br>v. වලංගු අධිකරණයක් විසින් අයදුම්කරු බුන්වත් පුද්ගලයකු වශයෙන් හඳුනාගෙන තිබුණිද? |

| | |
|---|---|
| 10 | නීති ක්ෂේත්‍රයට අදාල ජාත්‍යන්තර පිළිගත් සංගම්වල දරන ලද නිලතල, දක්වන ලද දායකත්වය සහ ලද සම්මානඃ- |
| 11 | නීතිඥවරයකු වශයෙන් අයදුම්කරු විසින් සිදු කරන ලද පර්යේෂණ පදනම් කරගෙන ප්‍රසිද්ධ කරන ලද ලිපි ලේඛන සහ ග්‍රන්ථ ඃ- |

*ප්‍රකාශනය*

ඉහත මවිසින් සඳහන් කරන ලද තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බවත්, කිසිදු අසත්‍ය තොරතුරක් හෝ අවශ්‍ය තොරතුරු යටපත් කිරීමක් කර නොමැති බව ප්‍රකාශ කරමි.

තවද, ජනාධිපති නීතිඥ තනතුර ප්‍රදානය කිරීමෙන් පසුව ද මවිසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය බවට සනාථ වුවහොත්, එම තනතුර අහෝසි කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය වෙත දැන්වීමට ජනාධිපති කාර්යාලය විසින් කටයුතු කරන බව ද හොඳාකාරව දනිමි.

අත්සන ඃ- ................................... .

දිනයඃ ........................... .

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.